ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරික්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 57

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

| රා.ගි.කා සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම | කාරක සභාවේ නිර්දේශයන්/නියෝග | ගණන් දීමේ නිළධාරි විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|
| සියළුම දිස්ත්‍රික්ක වල අනවසර ඉඩම් නියමානුකූල කර ඉඩම් බලපත්‍ර ලබාදිම | 2016 මැනුම් ඉල්ලීම නිම කිරිමට හැකිවූ බවත් චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගෙන සියළුම ඉඩම් වල දළ සැලැස්මක් සෑදීමට රු.මිලියන 9,000ක ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා ඉදිරියේදි රජයේ ප්‍රතිපාදන බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි පැවසීය. මේ සඳහා පිළියෙල කරන ලද ව්‍යාපෘති වාර්තාවේ පිටපතක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව නියෝග කළේය. | | |
| 2010-2016 වර්ෂවල ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු ඉතිරිවීම්වල පරාසය 4% සිට 12% දක්වා විචලනය විම | 2010 වසරේදි ලබාදුන් කිරි වීදුරුව පාසල් ළමුන්ට ලබා දිමට දෙමාපියන් ප්‍රතික්ෂේප කිරිම, ග්‍රාම නිලධාරි පුහුණු වැඩසටහන්වලට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදුන් ප්‍රතිපාදන වලින් කොටසක් ඉතිරිවීම, නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් ආදි කරුණු | වෙනත් දෙපාර්තමේන්තුවලින් ලැබෙන ප්‍රතිපාදන වියදම් කිරිම සඳහා කාලය ප්‍රමාණවත් නොවන්නේ නම් අදාල ප්‍රතිපාදන ආපසු හරවා යැවිම/ භාර නොගැනීම.<br><br>දිස්ත්‍රික් ලේකම් වැය ශිර්ෂයට අදාලව ලැබෙන ප්‍රතිපාදන | 2019 වර්ෂය ආරම්භයේදීම ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය සඳහා නිලධාරින් දැනුවත් කිරිම |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් වැටුප් හා දීමනා ඉතිරිවීමත් රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව වෙත ලබා දුන් ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයන් ඇති වීමත් මෙම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුවූ බව ප්‍ර.ග.නි/ග.නි පැවසිය. | සම්බන්ධයෙන් වර්ෂය මුලදීම සැලසුම් සකස්කර අදාල කටයුතු ආරම්භ කිරීම. | |
| 2010 මුදල් වර්ෂයේ විගණකාධිපති වාර්තාව අනුව කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් නිල නිවස,ගරු අමාත්‍යවරයකු වෙත වෙන්කර තිබුණු අතර 2017 ජුනි 16 දින ආපසු භාරදි ඇතත් මේ දක්වා අයවීමට ඇති හිඟ ගෙවල් කුලිය රු.160,776ක් වීම. | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමා හරහා එම මුදල වාරික වශයෙන් අයකර ගනිමින් සිටින බව ග.නි.පැවසීය. | 1.කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව පූර්ව රජයේ ගිණුම් පිළබඳ කාරක සභාව විසින් ගෙන තිබුණු නියෝග ක්‍රියාත්මක කිරිම යටතේ කරුණු දෙකක් පිළිබඳව කාරක සභා අවස්ථාවේ දි විමසූ අතර එම කරුණු දෙක පහත දැක්වේ.<br>(1) කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් නිළ නිවස ගරු අමාත්‍යවරයෙකු වෙත වෙන්කර දීම හා හිඟ නිවාස කුලිය අයනොකිරිම.<br><br>(11) රඹුක්කන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශිය ලේකම්වරයකු විසින් 2012 මාර්තු 23 දින වන විටත්, ඔහු පදිංචි නිළ නිවස සහ වට්ටෝරු භාන්ඩ භාර දි නොතිබුණු අතර, ස්ථාන මාරුවූ දින සිට හිඟ ගෙවල් කුලී සහ දුරකථන බිල්පත් ද ගෙවා නොතිබුණි.<br><br>02. එම කරුණු දෙකෙන් 11වන කරුණ වන රඹුක්කන ප්‍රාදේශිය | හිඟ ගෙවල් කුලිය වන රු.160,776ක මුදල මේ දක්වා ගෙවා නොමත. |

| | | | |
|---|---|---|---|
| | | ලේකම් කාර්යාලයේ නිළ නිවස 2017.06.25 දින ආපසුභාර දි ඇති අතර, එම නිළ නිවසේ හිග කුලී මුදල වන රු.260,323.00ක මුදල සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් එම නිලධාරියාගේ වැටුපෙන් මාසිකව අයකර අවසන් කරන ලදි.<br><br>03. 1 වන කරුණ යටතේ වන හිටපු අමාත්‍යවරයෙකුට වෙන්කර දුන් කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් නිළ නිවස 2017.06.16 දින ආපසු භාර දි ඇතත් හිග නිවාස කුළිය වන රු.160,776.00 ක මුදල ගෙවීම සඳහා මේ වනතුරු ද කටයුතු කර නොමැත. මෙම හිග මුදල අයකර ගැනීම පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාවේ දි සාකච්ඡා වුවද ඒ පිළිබඳව නිශ්චිත උපදෙසක් නොලැබුනි.<br><br>04. ඒ අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවන වාර්තාවේ 03 වන කරුණු යටතේ ප්‍රධාන ගණන් දිමේ නිලධාරි/ගණන් දිමේ නිලධාරිගේ කරුණු පැහැදිලි කිරිම සහ කාරක සභාවේ අදහස්/නිර්දේශ/නියෝග ඉහත පරිදි නිවරදි විය | |

| | | | |
|---|---|---|---|
| | | යුතු බැවින් එය නිවරදි කිරිමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත දැනුම් දෙන ලදි.<br><br>ගරු ඇමතිතුමාගේ විශ්‍රාම වැටුපෙන් හෝ හිඟ ගෙවල් කුලිය අයකර ගැනිමට ඇති හැකියාව විමසා බැලූ නමුත් එසේ හැකියාවක් නොමැති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත.<br><br>මිට අමතරව හිඟ ගෙවල් කුලී ගෙවන ලෙස අවස්ථා කිහිපයකදි දැනුම් දි ඇත. | |
| අරණායක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ඉටු කළ ව්‍යාපෘති 09කට අදාළව සාවද්‍ය මිනුම් යටතේ නොකළ වැඩ සඳහා රු.1,682,248ක් ගෙවා තිබිම හා සාවද්‍ය ගිණුම් සකස් කර ගෙවිම් කල සියළුම කාර්මික නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු නොකිරිම | පළාත් සභාවේ කාර්මික නිලධාරිනියට එරෙහි මේ සම්බන්ධව විනය පරික්ෂණයෙන් එම නිලධාරිනිය නිදහස් වි ඇති බව ප්‍ර.ග.නි පැවසිය. | 1. අයවිමට ඇති මුදල් සමෘද්ධි සමිතිවලින් අයකර ගැනිමට අනුමැතිය ලබා ගැනිම සඳහා සමෘද්ධි කොමසාරිස් ජනරාල් වෙත ලිපියක් යැවිමට 2017.07.21 දින පැවති විගණන කළමනාකරණ කමිටු රැස්විමේදි තිරණය විය .<br>2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු විසින් සිදු කරන ලද සම්පිඩණ පරික්ෂන වාර්තාව අනුව කර්මාන්ත 08ක් හොද තත්වයේ පවතින අතර එක් කර්මාන්තයක් පමණක් පරික්ෂණයෙන් අසමත් වි ඇත.<br>3. පරික්ෂණයෙන් අසමත්වූ කර්මාන්තයට අදාල ගොනුව අල්ලස් | පරික්ෂණයෙන් අසමත්වූ උඩපමුණුව දෙනවගල මාර්ගය සම්පීඩන ශක්තිය දුර්වල තත්ත්වයක පැවති හෙයින් ව්‍යාපෘතිය සඳහා වැයකල මුදල වන රු 412,641.40ක් මුදල කොන්ත්‍රාත් සමිතියෙන් අය කර ගැනීමට තීරණය විය. ඒ අනුව රු 97,510.00ක මුදලක් සමෘද්ධි බලකායේ 10% රැඳවුම් මුදලින් අය කර ගත් අතර, එම බලකායෙන් ඉතිරි මුදල් අයකර ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් වෙත 2017.12.06 දින ලිපියක් යවා ඇතත් අනුමැතිය ලබා දි නැත.<br><br>අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවෙන් එම ලිපි ගොනුවෙහි සහතික කළ පිටපතක් ගෙන්වා ගැනීමට ප්‍රමාදවූ අතර ඒ හේතුවෙන් පරික්ෂණ කටයුතු ආරම්භ |

| | | | |
|---|---|---|---|
| | | හෝ දූෂණ විමර්ෂණ කොමිෂමෙන් ගෙන්වා ගෙන එම ව්‍යාපෘතියට අදාලව පරීක්ෂණයක් සිදු කිරිමටත් 2017.12.08 දින පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදි තිරණය විය . | කිරිමද ප්‍රමාද විය. මේ වනවිට මෙම ව්‍යාපෘතියට අදාලව පරික්ෂණය සිදු කරමින් පවති. |
| 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කෑගල්ල හා වරකාපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල විශ්‍රාම වැටුප් විෂය භාර නිලධාරිනිය විසින් සහ 2010 හා 2011 වර්ෂවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් සම්බන්ධ විෂය භාර නිලධාරියා විසින් පරිගණක දත්ත කූට ලෙස වෙනස් කරමින් එකතුව රු.17,449,408/-ක විශ්‍රාම වැටුප් වංචා කර තිබුණි. මෙම වැටුප් වංචාවෙන් මේ වනවිට රු.683,648/-ක් පමණක් අයකරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් අදාල එක් පාර්ශවයකට එරෙහිව විධිමත් විනය පරික්ෂණ කටයුතු ආරම්භ කර ඇති අතර අනෙක් පාර්ශවයන්ට එරෙහිව මූලික පරික්ෂණ කටයුතු පමණක් අවසන් කර තිබිම. | SLIP (Sri Lanka Interbank Payment System) ක්‍රමය මගින් සිදු කර ඇති මෙම වංචාවට අදාළ නිලධාරින්ගේ වැඩ තහනම් කර ඇති බව හා විධිමත් විනය පරික්ෂණයක් හා අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරික්ෂණයක් සිදු කරන බව ග.නි පැවසිය. | <u>කෑගල්ල හා වරකාපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් වංචාව</u><br>1.මෙම මූල්‍ය වංචාවට අදාලව නිතිමය ක්‍රියාමාර්ග ගැනිම සඳහා අදාල ලිපි ලේඛණ හා සාක්ෂි ලේඛණ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.<br>2. මෙම පරික්ෂණයට අදාලව මු.රෙ 104(3) හා 104(4) පරික්ෂණ අවසන් කර ස්වදේශ කටයුතු ලේකම් හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කර ඇත.<br>3. මෙම මුදල් වංචනිකව තම පෞද්ගලික බැංකු ගිණුම්වලට බැරකර සිටි හිටපු විශ්‍රාම වැටුප් නිලධාරිනයට හා ඇයගේ ස්වාමිපුරුෂයා වන හිටපු ග්‍රාම නිලධාරිට විරුද්ධව මූලික පරික්ෂණය පවත්වා අවසන් කර වාර්තාව ඉදිරිපත් කර ඇත.<br>4.මෙම නිලධාරින් දෙදෙනා වැඩ තහනම් කර ඇති අතර ඔවුන්ට | <u>කෑගල්ල හා වරකාපොල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් වංචාව</u><br>1. මුදල් වංචාකල එක් අයකුගෙන් රු. 683,648 ක් අයකර ගෙන ඇත.<br>2. මෙම විශ්‍රාම වැටුප් වංචාවට අදාල හිටපු විශ්‍රාම වැටුප් නිලධාරිනියට හා හිටපු ග්‍රාම නිලධාරිට විරුද්ධව විධිමත් විනය පරික්ෂණය දැනට පවත්වාගෙන යනු ලැබේ.<br>3. 2019.03.10 දින වන විට හිටපු ග්‍රාම නිලධාරිගේ විධිමත් විනය පරික්ෂණයේ සැසි වාර 30ක්ද 2019.03.16 වන විට හිටපු විශ්‍රාම වැටුප් නිලධාරිනියට විරුද්ධව පැවැත්වෙන විධිමත් විනය පරික්ෂණයේ සැසි වාර 27 ක් පවත්වා ඇති අතර ඉදිරි පරික්ෂණ දිගටම පවත්වාගෙන යනු ලැබේ.<br>4. මෙම මූල්‍ය වංචාව පිළිබඳව අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් පොදු දේපල පනත යටතේ නඩු පවරා නිතිමය ක්‍රියාමාර්ග ගෙන කොළඹ අංක 05 දරන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව විභාගවෙමින් පවතී.<br>5. ස්වදේශ කටයුතු ලේකම්ගේ සහ මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි රජයට සිදුකර ඇති අලාභය අයකර ගැනීම සඳහා අංක |

| | | | |
|---|---|---|---|
| | | විරුද්ධව වෙන් වෙන්ව විධිමත් විනය පරීක්ෂණ ආරම්භකර පවත්වාගෙන යනු ලැබේ.<br>5. ස්වදේශ කටයුතු ලේකම්ගේ හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු උපදෙස් අනුව වංචාකල මුදල් අයකර ගැනීම සඳහා C185/2017(UP)යටතේ සිවිල් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර ඇත.<br>6. වංචනිකව මුදල් බැරකර තිබූ විශ්‍රාමිකයෙකුගෙන් රු.683,648.00 අයකරගෙන ඇත.<br>7. වංචනිකව මුදල් බැරකර තිබූ විශ්‍රාම වැටුප් නිලධාරිනියගේ නැන්දනියගේ (විශ්‍රාමික) විශ්‍රාම වැටුප තාවකාලිකව ගෙවීම් අත්හිටුවා ඇත.<br><br>කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් වංචාව<br><br>1.මෙම මුල්‍ය වංචාවට අදාලව නිතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල ලිපි ලේඛණ හා සාක්ෂි ලේඛණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.<br>2. මු.රෙ 104(3) පරීක්ෂණය අවසන් කර වාර්තා ඉදිරිපත් කර ඇත.<br>3. මු.රෙ 104(4) පරීක්ෂණය පවත්වා අවසන් කර ඇති අතර | C185/2017 (UP) යටතේ සිවිල් අධිකරණයේ නඩු පැවරීමට නිතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපිලේඛණ භාර දුන් නමුත් එම ලේඛන ආපසු භාර ගන්නා ලෙසත් මෙම මුල්‍ය වංචාව පිළිබඳව ආයතන සංග්‍රහයේ 33 පරිච්ඡේදයේ 4 වගන්තියේ ප්‍රතිපාදන යටතේ මෙම කරුණට පාදක වූ සිද්ධීන් සම්බන්ධ පැහැදිලි අදහසක් ලබා ගැනීම සඳහා සිද්ධි ප්‍රකාශයක් පමණක් ඉදිරිපත් කරන ලෙසත් දන්වා ඇති අතර එහි කෙටුම්පතක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.<br>6. මුදල් රෙගුලාසි 104(3) සහ 104(4) පරීක්ෂණ අවසන් කර වාර්තා ස්වදේශ කටයුතු ලේකම්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත.<br><br>කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් වංචාව<br><br>1. මූලික විමර්ශනය අවසන් කර වාර්තාව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත.<br>2. මු.රෙ.104(3) පරීක්ෂණය අවසන් කර වාර්තාව ඉදිරිපත් කර ඇත. මු.රෙ. 104(4) පරීක්ෂණයේ සාක්ෂි කැඳවීම අවසන් කර ඇති අතර වාර්තාව සකස් කරමින් පවතින බව කෑගල්ල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.<br>3. කෑගල්ල දිස්ත්‍රික් ලේකම් |

| | | | |
|---|---|---|---|
| | | පරීක්ෂණ මණ්ඩලය විසින් වාර්තාව සකස් කරමින් පවතී.<br>4.දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හිටපු විශ්‍රාම වැටුප් නිලධාරියාට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය ලිපි ලේඛණ හා සාක්ෂි ලේඛණ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් මගින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. | කාර්යාලයේ හිටපු විශ්‍රාම වැටුප් නිලධාරියාට (වර්තමාන තනතුර පුහුණු කිරීමේ සහකාර-අධ්‍යයන) විරුද්ධව විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් චෝදනා පත්‍රය හා අදාල ලිඛිත සාක්ෂි ලේඛන 2018.08.28 දින කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දී ඇති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත.<br>4. විධිමත් විනය පරීක්ෂණයට අදාල ලිපි ලේඛණ චූදිත නිලධාරි නීල් සුජීව ජයසිංහ මහතා වෙත භාර දීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත යවා ඇති අතර එම ලිපිලේඛණ චූදිත නිලධාරි වෙත භාරදී ඇති බව වාර්තා කර ඇත.<br>5.මෙම විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීම සඳහා ඒකපුද්ගල විනිශ්චය සභාවක් සහ පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරියකු පත්කර ඇති බව මටද පිටපතක් සහිතව එම නිලධාරීන් වෙත කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019.01.31 දින දන්වා ඇත.<br>6. මෙම පරීක්ෂණය පැවැත්වීම සඳහා පත් කර ඇති පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරී වෙත කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් පරීක්ෂණය පැවැත්වීම පිළිබඳව දුරකථනය |

| | | | |
|---|---|---|---|
| | | | මඟින් 2019.03.13 දින විමසීමේදී එම නිලධාරියා පවසා ඇත්තේ ඔහුට එම පරීක්ෂණය කිරීමට අපහසු බැවින් ඒ බව අධ්‍යක්ෂ ජනරාල් වෙත නොපමාව දැනුම් දෙන බවය.<br>7.අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අංක 14414/4/14 යටතේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුපවරා ඇත. එසේම මෙම පරීක්ෂණයට අදාල විමර්ශන තවදුරටත් සිදු කරමින් පවතින බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018.12.28 දින දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇත. |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ඉදිකිරීම් කටයුතු සඳහා රු.21,117,316/-ක ඇස්තමේන්තුවකට භාරදුන් දිප්පිටිය සති පොළ 1 හා 11 අදියරයන්හි ඉදිකිරීම් කටයුතු භාරදුන් තුත්තිරිපිටිය බස්නැවතුම්පල 2014 වසරේදි අවසන් කිරීමට නියමිතව තිබුණද 2017 මාර්තු 31 වන විටද වැඩ අවසන්ව නොතිබීම හා මේ වන විටද ඇස්තමේන්තු මුදලින් රු.10,179,131/-ක් වැය කර තිබීම. | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සාකච්ඡාවක් පැවැත්වීමට සැලසුම් කර ඇති බව ග.නි.පැවසිය. | 2013.07.10 දිනැති අංක13/0976/504/077 දරණ කැබිනට් පත්‍රිකාව මඟින් අනුමැතිය ලද කර්මාන්ත 20න් 1ක් වන මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි.<br>2019.03.08 දින පවත්වන ලද පළමු දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීමට මෙම කරුණු ඉදිරිපත් කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් කැබිනට් පත්‍රිකාවක් යොමු කර ප්‍රතිපාදන ලබා ගැනීමට දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී.<br>ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් කරුවෙකු තෝරාගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගෙන් රු.මි.33.75 ක ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර එම ප්‍රතිපාදන ලද පසු මේවන විට වැඩ අවසන් කර නොමැති කර්මාන්ත ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | ලෙස 2019.03.14 දින ස්වදේශ කටයුතු ලේකම්ගෙන් ඉල්ලා ඇත. | |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2014 වර්ෂයේදි රු.32,088,750 ක් වැය කර ඉදිකරන ලද වරකාපෙල සතිපොල,යටිතල පහසුකම් සම්පූර්ණ නොකිරිම හේතුවෙන් මේ වනවිටත් නිෂ්කාර්යව පැවතිම | මෙය පෞද්ගලික ඉඩමක් බව වෙනත් පාර්ශවයකි හිමිකම්පාමින් නිතිමය ක්‍රියාමාර්ගයකට එළඹී ඇති බැවින් මෙසේ නිෂ්කාර්යව පවතින බව ග.නි පැවසිය. මෙම ඉඩම සඳහා හිමිකම් පෑම නීත්‍යානුකූල නොවේ නම් ව්‍යාජ හිමිකම්පෑම පිළිබඳ නඩු ගාස්තු සමග අදාල පාර්ශවකරවන්ගෙන් අයකර ගැනිමට කටයුතු කරන ලෙස කාරක සභාව නියෝග කළේය. | සතිපොල ඉදිකිරිම අවසන් කර ඇති අතර සතිපොලෙහි වෙළඳ කටයුතු ආරම්භ කර ඇත.<br>බස් නැවතුම්පලේ ඉදිකිරීමේ නඩුවට අදාල ඉඩමේ අයිතිය තහවුරු කරගැනීම සඳහා පාර්ශවකරුවකු ලෙස වරකාපොල ප්‍රාදේශීය ලේකම් වෙනුවෙන් එහි ඉඩම් නිලධාරි සාක්ෂි ලබා දීමට කැඳවා සිටි නමුත් අධිකරණය විසින් එම සාක්ෂියට ප්‍රථම අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය කෑගල්ල වෙතින් සාක්ෂි කැඳවන ලෙස විත්තියට දන්වා ඒ සඳහා 2019.03.12 දින ලබා දී තිබුණි.<br>ඒ අනුව 2019.03.12 දින සාක්ෂි ලබා දීමට අධ්‍යක්ෂ වරයා කැඳවා තිබුණද විත්තියේ නීතිඥ මහතා විසින් එකී සාක්ෂිය කැඳවීම විත්තියට අවාසිදායක විය හැකි බැවින් විත්තියේ නීතිඥ මහතා විසින් එම කැඳවීම නවත්වා ඇත.<br>එදින පැමිණිල්ල විසින් දින ඉල්ලා සිටීම නිසා අධිකරණය විසින් 2019.04.30 දින ලබා දී ඇත් අතර එදිනට වරකාපොල ප්‍රා.ලේ කාර්යාලයේ සාක්ෂිකරු නැවත කැඳවන බවත් | 2019.04.30 දින ප්‍රාදේශිය ලේකම් විසින් අධිකරණයේ දි සාක්ෂි ලබාදිමෙන් අනතුරුව ලබාදෙන නඩු තීන්දුව ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| | | එදිනට විත්තිය විසින් කැඳවන සාක්ෂි අවසන් කරන බවත් විත්තියේ නීතිඥ මහතා විසින් දන්වා ඇත. | |

.................................

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කෑගල්ල

එල්. ජේ. එම්. ජී. චන්ද්‍රසිරි බණ්ඩාර
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කෑගල්ල
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්

.................................

ප්‍රධාන ගණකාධිකාරී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කෑගල්ල

ජේ. ඒ. ඒ. සී. තිල්මල්ගොඩ
ප්‍රධාන ගණකාධිකාරී
කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

එච්.වී. කමල් පත්මසිරි
ලේකම්
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

එච්.වී. කමල් පත්මසිරි
ලේකම්
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශ හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙස දැනුවත් කරමින් මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් අදාළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් සේවා දෙන ලද අඩුපාඩු මඟහරවා ගනිමින් 2019 හා 2020 වර්ෂය තුළදී එහි සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ලඟා කරවීමට අපේක්ෂා කරමි.

වජිර අබේවර්ධන (පා.ම.)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

වජිර අබේවර්ධන
අමාත්‍යතුමා
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය